# ධර්මවාදය හා පැවැත්ම

ධර්මතාවක් ඉපිද පැවතී නැතිවන්නේ යැයි අපි කියමු. උත්පාද, ඨිති, භංග යනුවෙන් මෙය ඇතැම්විට හැඳින්වෙයි. පරමාර්ථ ධර්ම යනුවෙන් හැඳින්වෙන චිත්ත, චෛතසික, රූප නිර්වාණ යන්නෙන් නිර්වාණ යන්න කෙසේ වෙතත් අනෙක් ධර්ම සම්බන්ධයෙන් උත්පාද, ඨිති, භංග අදාළ වන්නේ යැයි කියනු ලැබෙයි. නිර්වාණය කිසිම අයුරකින්වත් ඉපිද පැවතී නැතිවන්නක් ලෙස සැළකිය නො හැකි ය.

මේ පැවතීම යන්න කෙතරම් කාලයකට ද යන්න මෙහි දී අනිවාර්යයෙන් ම පැන නගින ප්‍රශ්නයක් වෙයි. එයට පිළිතුරක් ලෙස ඇත්තේ ක්‍ෂණවාදය ය. මේ ප්‍රශ්න තුන්වැනි සංගායනාවේ දී සාකච්ඡා වී ඇති බවත් ඇතැම් රහතන් වගන්සේලා ධර්මවාදය හා ක්‍ෂණවාදය පිළිගෙන නැති බවත් පැහැදිලි ය. ඇතැම් ධර්ම කරුණු මෙන් ම වෙනත් දෑ පිළිබඳව ද රහතන් වහන්සේලා අතර ද විවිධ මත තිබී ඇති බව පැහැදිලි ය. රහතන් වහන්සේ අතර ඇති වූ විවාද පිළිබඳ ව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි. මෙයින් කියැවෙන්නේ රහතන් වහන්සේ ද ඇතැම් කරුණු සම්බන්ධයෙන් නිශ්චිත මතයක නොපිහිටි බව ය.

චිත්තයක් පවතින්නේ චිත්තක්‍ෂණයකට යැයි කියනු ලැබෙයි. එමෙන් ම රූපයක් රූපක්‍ෂණයක පවතින්නේ යැයි කියැවෙයි. රූපක්‍ෂණයක් යනු චිත්තක්‍ෂණ දහහතක් බව අභිධර්මයෙහි සඳහන් වෙයි. මෙයින් පැහැදිලිවන්නේ චිත්තක්‍ෂණයක් රූපක්‍ෂණයකට වඩා කුඩා බව ය. රූපයක් චිත්තයක් පවතින කාලය මෙන් දහහත්වාරයක් පවතින බව මෙයින් ගම්‍ය වෙයි. මේ පැවැත්ම කෙතරම් දුරට වාස්තවික වූවක් ද? වෙනත් වචනවලින් කිවහොත් චිත්ත, චෛතසික, රූප යන ධර්මවල පැවැත්ම අපෙන්, එනම් සත්වයාගෙන් ස්වායත්ත ද?

මේ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් අපේ සාහිත්‍යයෙහි ඇතැයි නො සිතමි. ඒ පැවැත්ම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර කිවයුත්තක් වෙයි. උත්පාද ඨිති භංග යන්න සියළු බෞද්ධ ගුරුකුලවලට පොදු වූවක් නො වේ. ථෙරවාදයෙහි එලෙස තිථි හෙවත් පැවැත්මක් දැකිය හැකි නමුදු සෞත්‍රාන්තිකයන් අතර ඨිති නැත. ඔවුන්ට ඇත්තේ උත්පාද හා භංග පමණ ය. ථෙටවාදීන්ගේ පැවැත්ම යන්න මහායානිකයන්ගේ මෙන් ම වෙනත් හීනයානිකයන්ගේ ද විවේචනයට හසු වී ඇත.

නිර්වාණ යන්න පවත්නා ධර්මයක් විය නො හැකි ය. එසේ වුවහොත් නිර්වාණය තවත් සංකල්පයක් බවට පත් වෙයි. මාධ්‍යමිකවාදීන් වරද්දා ගත් තැන ද එය විය. නිවණ තවත් සංකල්පයක් ලෙස ගැනීමෙන් ඒ සසරට සාපේක්‍ෂව ගැනීමට නාගර්ජුනපාදයන් වහන්සේට සිදුවිය. නිවණ එසේ අනෙක් ධර්ම තුනෙන් වෙන්කර ගත්විට අපට ඇති ප්‍රධාන ප්‍රශ්නය වනුයේ ඒ අනෙක් ධර්ම තුන අපෙන්, එනම් සත්වයාගෙන් තොරව පවතින්නේ ද යන්න ය.

මේ ධර්මවලට පරමාර්ථ ධර්ම යනුවෙන් නම්කර ඇත්තේ ඇයි? මෙහි දී ද අපි නිවණ හැරෙන්නට අනෙක් ධර්ම පමණක් ගනිමු. මෙහි පරමාර්ථ යන්න ඇතැමුන් තේරුම් ගෙන ඇත්තේ වාස්තවික යන අර්ථයෙන් බව පැහැදිලි ය. පරමාර්ථ යන්නට විරුද්ධව සම්මුති යන්න යෙදීම නිසා ද මේ තත්වය උද්ගත වී ඇත. සම්මුති ධර්ම පවතින්නේ සම්මුතියෙන් එනම් සමාජයේ පුද්ගලයන් අතර සම්මුතියෙන් යන්න මෙහි දී කියැවෙයි.

සම්මුති ධර්ම සාපේක්‍ෂ වෙයි. ඒ ඒ සමාජවලට, සංස්කෘතීන්ට සාපේක්‍ෂව නිර්මාණය කරගනු ලැබූ සංකල්ප සම්මුති ධර්ම වෙයි. පුටුව යනු සම්මුතියෙන් පවතින සංකල්පයක් මිස, ඒ ඒ සංස්කෘතියට සාපේක්‍ෂව ඇති සංකල්පයක් මිස වෙනත් දෙයක් නො වෙයි. පුටුව යන්නට පැවැත්මක් නැත. එය අප විසින්, සමාජය විසින් සම්මුතියෙන් නිර්මාණය කරගනු ලැබූ සාපේක්‍ෂ සංකල්පයක් වෙයි.

එහෙත් පරමාර්ථ ධර්ම එලෙස සම්මුතියෙන් නිර්මාණය කරගනු ලැබූ සංකල්ප නොවන පරමාර්ථ වශයෙන් ම පවතින සංකල්ප යැයි බොහෝ දෙනා අදහස් කරන බව පෙනෙයි. එහෙත් පරමාර්ථ ලෙස යමක් පැවතීම යනු අපෙන් තොරව පැවතීමකි. එවැනි පැවැත්මක් ආත්මවාදී වෙයි. අප සම්මුතියෙන් අපට සාපේක්‍ෂව යමක් පවතින්නේ යැයි කීම එකකි. එවැන්නක පැවැත්ම සාපේක්‍ෂ වෙයි. එහෙත් යමක් අපෙන් තොරව සාපේක්‍ෂ නොවී පරමාර්ථ වශයෙන් පවතින්නේ යැයි කීම ආත්මවාදයට හසුවෙයි. මෙහි දී ආත්මවාදී යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලාත්මවාදී වීම පමණක් නොවේ.

© Prof. Nalin De Silva

ධර්මාත්මවාදය ද ආත්මවාදයක් වෙයි. යම් සංකල්පයකින් ඇත්තට ම පවතින දෙයක් නිරූපණය වන්නේ යැයි ගැනීම ආත්මවාදී වෙයි.

ඇත්තට ම පවතින යන්න විශ්ලේෂණය කළ විට පෙනී යන්න නම් ඇත්ත යන්න ද ඇති බව එසේත් නැත්නම් පැවතීම සමග බැඳී ඇති බව ය. ඇති දේ ඇත්ත වෙයි. සත්‍යය යන්නෙන් ද එවැනි තේරුමක් ලැබෙයි. සත් යන්නෙන් කියැවෙන්නේ පවතින බව ය. ඇත්තට ම පවතින යන්න පුනරුක්තියක් පමණ ය. ඇත්ත යන්නෙහි පවතින යන්න අන්තර්ගත වෙයි. නිවන් දැකීමෙහි දී අපට බාධාවක් වන්නේ පුද්ගලාත්මවාදී වීම පමණක් නො වේ. ධර්මාත්මවාදී වීම ද නිවණට බාධාවක් වෙයි.

එහෙත් පරමාර්ථ ධර්ම එසේ අපෙන් තොරව පවතින, එසේත් නැත්නම් සාපේක්ෂ නොවන අර්ථයකින් පවතින, දේ ලෙස ගතයුතු නැත. බෝධි භික්ෂුන් වහන්සේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඉංගිරිසි පරිවර්තනයට ලියූ පෙරවදනෙහි සඳහන් කර ඇත්තේ නිවණ හැරෙන්නට පරමාර්ථ ධර්ම ලෙස දක්වා ඇති ධර්ම යනු මනසට ගතහැකි කුඩාම ධර්ම බව ය. මනස යනු කෙතරම් සියුම් වුවත් යම් ගොරහැඩි බවකින් යුක්ත වූවකි. එවැනි මනසකට ගත හැකි කුඩා ම ධර්ම වෙයි. චිත්ත යනු මනසට ගතහැකි කුඩා ම ධර්ම වෙයි.

ඒ අර්ථයෙන් ගත්කල එක් එක් අයගේ චිත්තක්ෂණ වෙනස් විය හැකි ය. මනසෙහි සියුම් බව වැඩිවත් ම චිත්තක්ෂණය ද අඩුවන්නේ යැයි අපට සිතිය හැකි ය. ගොරහැඩි මනසක චිත්තක්ෂණයක් වැඩි කාලයක් ගන්නේ නම් එය පුදුමයට කරුණක් නොවිය යුතු ය. අනෙක් අතට සියල්ලන්ගේ ම චිත්තක්ෂණ එකම නම් එවිට චිත්තක්ෂණය යන්න අප එකිනෙකාගෙන් ස්වායත්ත විය යුතු ය. එවිට නිරපේක්ෂ චිත්තක්ෂණයක් ඇතැයි ගැනීමට සිදුවෙයි.

යම් පුද්ගලයකු සම්බන්ධයෙන් ගත්කල ඒ අයගේ චිත්තක්ෂණයට වඩා කුඩා පැවැත්මක් ඇති ධර්ම පවතින්නේ ද යන්න අපට ඇසිය හැකි තවත් ප්‍රශ්නයකි. පැහැදිලිව ම යම් පුද්ගලයකු සම්බන්ධයෙන් ගත්කල එවැනි ධර්ම පවතින්නේ නම් එයින් කියැවෙන්නේ ඒ අයට ගෝචර නොවන සංකල්ප පවතින බව ය. දැන් අපට වඩා සියුම් මනසක් ඇති අයකුගේ චිත්තක්ෂණයට වඩා කුඩා පැවැත්මක් ඇති ධර්ම පවතින්නේ දැයි ප්‍රශ්න කළ හැකි ය. මෙලෙස වඩ වඩාත් සියුම් මනස් තෝරාගැනීමෙහි ප්‍රතිඵලය වන්නේ ඉතාම සියම් මනසට ගෝචර නොවන ධර්ම පවතින්නේ යැයි පිළිගැනීම ය. එවිට ඉන් කියැවෙන්නේ අනෙක් මනස්වලට ද ගෝචර නොවන ධර්ම පවතින බව ය. එසේත් නොවේ නම් අපෙන් තොරව ධර්ම පවතින බව ය.

එවැනි ධර්ම පවතින්නේ යැයි අපට දැනගැනීමට ක්‍රමයක් නැත. ඒ හුදෙක් උපකල්පනයක් පමණක් බවට පත්වෙයි. එසේත් නැතහොත් එවැනි ධර්ම දෙවියන් වහන්සේගේ මනසෙහි ඇති ධර්ම ලෙස සැලකීම ය. එහි ඇති වටිනාකමක් නැති බව බෞද්ධයනට අමුතුවෙන් කිවයුතු නො වේ. ඇතැමුන්ට මනසින් තොරව ධර්ම ඇතැයි පිළිගැනීම අත්‍යවශ්‍ය වී ඇත. එසේ වන්නේ ඔවුන් අඩුම තරමින් ධර්මාත්මවාදීන් වීම නිසා ය. පැවැත්ම යන්න මනසින් තොරව ගතහැකි ධර්මයක් නො වේ. පැවැත්ම පමණක් නොව උත්පාද හා භංග යන්න ද මනසට සාපේක්ෂ වෙයි. උත්පාද, ඨිති, භංග යන්නෙහි ඨිති පමණක් නැතිකිරීම මගින් සෞත්‍රාන්තවාදීන් උත්පාද හා භංග යන්නට නිරපේක්ෂ අර්ථයක් දී ඇති බව පෙනෙයි. එහි වරදක් ඇත. උත්පාද, ඨිති, භංග යන තුනම මනසට සාපේක්ෂව නිර්මාණය කෙරී ඇති සංකල්ප ලෙස ගත යුතු ය.

© Prof. Nalin De Silva